**කැලණිය විශ්වවිද්‍යාලය - 2018**
**-------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

කැලණිය විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම්කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි ඡේද අංක 19 ඡේදයට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ මූල්‍ය නොවන ප්‍රවාහයක් ලෙස බාහිර පාර්ශවයෙන් ලද ද්‍රව්‍යමය පරිත්‍යාග වටිනාකම රු.2,441,337 ක් මුදල්මය ගලායාමක් ලෙස දක්වා තිබුණි. තවද ප්‍රමාණවත් සාක්ෂි සහ පැහැදිලිකිරීම් ඉදිරිපත් නොකළ රු.58,700 ක් මුදල් ගලා ඒමක් ලෙසද ඇතුළත් කර තිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 දෙසැම්බර් 31 දිනට භෞතික තොග සමීක්ෂණ වාර්තාව අනුව තොග ශේෂය රු.37,974,423 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.30,930,694 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.7,043,729 ක වෙනසක් පැවතුණි. එම වෙනසට අදාළ හේතු හඳුනාගෙන අවශ්‍ය ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | වෙනසට හේතු මේ වනවිට හඳුනාගෙන ඇති අතර 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | භෞතික තොග සමීක්ෂණ වාර්තාවෙහි සඳහන් තොග ශේෂය සමඟ ලෙජර් ගිණුමේ තොග ශේෂය ගැලපිය යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේදී මෝටර්රථවලට අදාළව ක්‍රමක්ෂය රු.22,988,000 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි. | 2019 වර්ෂයේදී ජ'නල් සටහන් මඟින් ගැලපීම් කිරීමට කටයුතු යොදා ඇත. | ප්‍රාග්ධන ප්‍රදාන උපයෝගී කරගෙන මිලදී ගන්නා වත්කම් වෙනුවෙන් ක්‍රමක්ෂය නිවැරදිව ගැලපිය යුතුය. |
| (ඇ) අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණ අතර එම වත්කම්වල අගය වාර්ෂිකව සියයට 20 බැගින් ක්ෂය කර තිබුණි. | 2019 වර්ෂයේදී ජ'නල් සටහන් මඟින් ගැලපීම් කිරීමට කටයුතු යොදා ඇත. | අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඈ) වාර්ෂිකව අපහරණය කරන ස්ථාවර වත්කම් හඳුනාගෙන එම වටිනාකම් ගිණුම්වලින් ඉවත්කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදීද අපහරණය කරන ලද වත්කම් වෙන්දේසි කර ලැබුණු රු.427,879 ක මුදලක් වත්කම් අපහරණ ගිණුමකට ගලපනු වෙනුවට වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණි. එම වත්කම් ගිණුම්වලින් හා ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමටද කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බැවින් ඉන් පසුව අදාළ ගැලපීම් සිදුකිරීමට සටහන් කරගෙන ඇත. | ස්ථාවර වත්කම් අපහරණය කිරීමේදී නිවැරදිව ලෙජර් ගිණුම්වල අදාළ ගැලපීම් කළ යුතු අතරම ස්ථාවර වත්කම් ලේඛනයද යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. |
| (ඉ) පරිගණක හා තාක්ෂණ පීඨය සඳහා මාසිකව වැට් බදු සමඟ රු.2,029,750 ක කුලියකට වර්ග අඩි 39,000 ක ගොඩනැගිල්ලක් අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියකින් තොරව කුලියට ගෙන තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු ප්‍රාග්ධන ප්‍රතිපාදනවලින් රු.70,514,859 ක් පුනරාවර්තන ස්වරූපයේ වියදමක් වූ කුලී ගෙවීම හා අනෙකුත් වැඩිදියුණු කිරීම් සඳහා වැයකර තිබුණි. | ගොඩනැගිල්ලේ කුලී හා නවීකරණ මුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රතිපාදනය යටතේ අනුමත වී ඇති අතර ගිවිසුම් ප්‍රකාරව අදාළ අනුමැතීන් මත වියදම් දරා පුනරාවර්තන ස්වභාවයේ මූලධන වියදම් ලෙස ගිණුම්ගත කර ඇත. | ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රදාන නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | 108,347 | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර තැන්පතුවක අයිතිය හා පැවැත්ම තහවුරු කර ගත හැකි පරිදි අදාළ තැන්පතු සහතිකය, බැංකු ශේෂ සනාථ කිරීම් හා පොළී ආදායම් ලැබීම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙම ස්ථාවර තැන්පතු පිළිබඳ තොරතුරු ලබා ගැනීමට රාජ්‍ය බැංකුවලට ලිපි යවා ඇත. | ස්ථාවර තැන්පතු ශේෂ සනාථ කිරීම සඳහා තැන්පතු සහතික සහ ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ සේවකයන් 19 දෙනෙකුට ලබාදී තිබූ එකතුව රු.1,599,159 ක් වූ ණය ශේෂ අයනොවී පැවති අතර ඉන් වර්ෂ 5 ක් ඉක්මවූ අය නොවන ණය ශේෂය රු.526,847 ක් ද වර්ෂ 3 සිට වර්ෂ 5 අතර වූ ණය ශේෂය රු.828,954 ක් ද වර්ෂ 1 සිට වර්ෂ 2 අතර වූ ණය ශේෂය රු. 203,358 ක් ද වූ අතර මෙම ණය අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වෙනත් විශ්වවිද්‍යාලවලට ස්ථානමාරු ලැබූ අයගේ ණය ශේෂ අයකර ගැනීමට සහ ඉතිරි අයගේ ණය ශේෂ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු සකස් කර ඇත . | සේවක ණය අයකර ගැනීම සඳහා කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ කාර්යයන් සඳහා විශ්වවිද්‍යාලයේ තැන්පත්කළ වර්ෂ දෙක ඉක්මවූ විවිධ තැන්පතුවල වටිනාකම රු.50,751,301 ක්වූ අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | උපරිම ප්‍රමාණයක් නිදහස් කිරීමට කටයුතු කරන අතර ඉතිරිය ඉදිරියේදී ආදායමට ගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ආදායමට ගතහැකි තැන්පතු ආදායමට ගැනීම. |

## 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අත්තිකාරම් එය දෙන ලද කාර්යය නිමකළ විගස පියවීමට කටයුතු කළ යුතු වුවත් වර්ෂයකට වඩා වැඩි කාලයක් ඉක්මවූ නොපියවූ අත්තිකාරම් ශේෂය රු.3,667,108 ක් විය. | පියවීම් වවුචර්වල අඩුපාඩු හේතුවෙන් පියවීම ප්‍රමාදවී ඇත. 2019 වසරේදී අත්තිකාරම් පියවීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් යොදා ඇත. | අදාළ කාර්යය නිමවූ විගස නිරවුල් කිරීම සඳහා විධිමත් පාලන ක්‍රම ක්‍රියාත්මක කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| මුදල් රෙගුලාසි 102,103 හා 104 සහ 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2014/පුස/1/2016 (සංශෝධිත) දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛය | 2017 දෙසැම්බර් 31 දින සිදුකළ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාවට අනුව නැතිවූ පොත් 24,721 ක් හා 2003 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ කථිකාචාර්යවරුන් සහ සිසුන් විසින් ලබාගෙන 2019 පෙබරවාරි 07 දින දක්වාම නැවත භාරදී නොතිබූ පොත් 4,366 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නැතිවූ පොත් 24,721 ක් කපා හැරීම සඳහා පාලක සභා අනුමැතිය ඉල්ලීමට කටයුතු කර ඇති අතර ආපසු භාර නොදුන් පොත් සම්බන්ධ වාර්තාවක් සකස් කරමින් පවතී. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01.05.06 ඡේදය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2019 මැයි 17 දින ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වසර දෙකක පමණ කාලයක සිට ධාවන තත්ත්වයෙන් ඉවත් කර ඇති බස්රථ 02 ක් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණ මණ්ඩලයක් පත්කර එහි නිර්දේශ ලැබීමෙන් පසුව අපහරණය කිරීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු ගිණුම් 03 ක 2016 හා 2017 වර්ෂවල සිට පැවත එන එකතුව රු.2,905,653 ක් වූ හඳුනා නොගත් සෘජු බැර කිරිම් හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. | රු.75,000 ක් 2019 වර්ෂයේදී හඳුනාගෙන ඇති අතර වර්තමානයේ දෛනිකව ගිණුම් පරීක්ෂා කර හඳුනානොගත් බැර කිරීම් සඳහා බැංකුව විමසා අදාළ ගැලපීම් සිදුකරයි . | සෘජු බැරකිරීම් හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.613,994,350 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.365,899,881 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.248,094,469 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ පුනරාවර්තන ප්‍රදාන රු.479,933,000 ක් හා අනෙකුත් ආදායම් රු. 224,439,143 කින් වැඩිවීම හා සේවක පාරිශ්‍රමික වියදම රු. 472,851,171 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාලය විසින් දේශන ආවරණය කිරීම සඳහා බාහිර කථිකාචාර්යවරුන් විශාල සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඒ වෙනුවෙන් දරන ලද වියදම රු.47,143,233 ක් විය. නියැදි පරීක්ෂාවකදී පීඨ දෙකක බාහිර කථිකාචාර්යවරුන් 285 | බාහිර කථිකාචාර්යවරුන්ට හා කථිකාචාර්යවරුන්ට අදාළ පරිදි දේශන පැය වෙන්කර ඇති අතර සිසුන්ට පාඩුවක් සිදු නොවන ලෙස | නිසි ක්‍රමවේදයක් යටතේ බාහිර කථිකාචාර්යවරුන්ට දේශන පැය වෙන්කිරීම සිදුකළ යුතු අතර |

| | | |
|---|---|---|
| දෙනෙකු බඳවාගෙන තිබුණු අතර දේශන පැය 871 ක් ආවරණය කිරීමට පත්කළ බාහිර කථිකාචාර්යවරුන් 33 දෙනෙකු විසින් එකම දේශනයක්වත් පවත්වා නොතිබුණු අතර වෙන්කළ දේශන පැය ගණනින් අඩකට අඩු ප්‍රමාණයක් ආවරණය කළ කථිකාචාර්යවරුන් සංඛ්‍යාව 53 ක් විය.<br>බාහිර කථිකාචාර්යවරුන් හා තාවකාලික කථිකාචාර්යවරුන්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ස්වයං අධීක්ෂණයකට ලක්වන පරිදි පිළියෙල කළ පැමිණීමේ ලේඛන භාවිතා කර නොතිබුණි. | අතිරේක දේශන පවත්වා අධ්‍යයන කටයුතු සිදු කරයි. | පැමිණීම හා පිටවීම සටහන් කිරීමට විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. |
| (ආ) 2018 වර්ෂය වනවිට විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ හා දුරස්ථ අධ්‍යයන ක්ෂේත්‍රයේ ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 99,174 ක් වූ අතර 2018 වර්ෂයේ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 7,855 ක් විය. 2003 වර්ෂයේ සිට 2018 දක්වා ලියාපදිංචිවූ සිසුන්ගෙන් 4,587 ක් සමාලෝචිත වර්ෂයේදී උපාධිය සම්පූර්ණ කර තිබුණි. බාහිර උපාධි පාඨමාලා 04 ක පසුගිය අධ්‍යයන වර්ෂ 03 ට අදාළ විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 09 සිට වසර 02 දක්වා කාලයක් ගතකර තිබුණි. | උත්තර පත්‍රයක් පරීක්ෂකවරුන් දෙදෙනෙකු විසින් ඇගයීමට ලක්කළ නිසා ලකුණු ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද විය. මෙම ප්‍රමාදය අවම කිරීමට සම්මේලන ක්‍රමයට උත්තර පත්‍ර ඇගයීම හඳුන්වා දී ඇත. | විභාග ප්‍රතිඵල කඩිනමින් ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඇ)වටිනාකම රු.346,500 ක් වූ ලැප්ටොප් පරිගණක 03 ක් ලබාගත් කථිකාචාර්යවරුන් තිදෙනෙකු 2016 වර්ෂයෙන් පසු සේවයෙන් ඉවත්වීම හා මියයාම හේතුවෙන් ආපසු භාර දී නොතිබුණි. | එක් පරිගණකයක් ආපසු භාරදී ඇති අතර ඉතිරි පරිගණක ආපසු ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | නිලධාරීන් සේවයෙන් ඉවත්වියාමේදී හා මියගිය අවස්ථාවලදී නිකුත්කළ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ආපසු ලබා ගැනීමට ක්‍රමවේදයක් ඇති කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2012 මාර්තු මාසයේ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා නිකුත්කළ ආචාරධර්ම පද්ධතියට අනුකූලව කථිකාචාර්යවරයෙකු විසින් පැවැත්විය යුතු අවම දේශන පැය ප්‍රමාණයක් තීරණය කර තිබුණද අවම වශයෙන් එම පැය ගණන හෝ වෙන් කර නොතිබුණු අවස්ථා පැවති අතර නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි එක් අධ්‍යයන අංශයක 2016/2017 වර්ෂය සඳහා ස්ථිර අධ්‍යයන කාර්යමණ්ඩලය 15 දෙනෙකු සඳහා වෙන්කළ යුතු දේශන පැය ගණන 91 ක් වුවත් වෙන්කර තිබුණු පැය ගණන 58 ක් වූ අතර ඔවුන් විසින් එයින් දේශන පවත්වන ලද පැය ගණන 32 ක් වී තිබූ බැවින් එම අවම පැය ගණන හෝ දේශන පවත්වා නොතිබුණි. | විවිධ හේතූන් නිසා ඇතැම් අවස්ථාවල දේශන නොපැවත්වුවද විද්‍යාර්ථීන්ට පාඩුවක් සිදුනොවන ලෙස හැකි පමණ අතිරේක දේශන පවත්වයි. | විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ ආචාරධර්ම පද්ධතියට අනුව ආචාර්යවරුන් සඳහා දේශන පැය වෙන්කිරීම සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ දේශන පැවැත්වීම සනාථ කර ගැනීම තහවුරුවන මූලික ලියවිල්ල ශිෂ්‍ය අත්සන් ලේඛනය වන නමුත් එම ලේඛනවල දේශන පැවැත්වූ දිනය, විෂය අංකය, කථිකාචාර්යවරයාගේ නම හා අත්සන, දේශන පැවැත්වූ වේලාව, අධ්‍යයන වර්ෂය ආදිය සඳහන් නොකළ අවස්ථා රැසක් පැවතුණි. | පීඨ කාර්යාල මගින් පවත්වාගෙන යනු ලබන අත්සන් ලේඛනවල පැමිණීම, පිටවීම සටහන් කරන අතර සමහර ආචාර්යවරුන් දේශන පැවැත්වීම සනාථ කිරිමට අවශ්‍ය ශිෂ්‍ය අත්සන් ලේඛන ලබාගෙන නැත. | ශිෂ්‍ය අත්සන් ලේඛන නිසි පරිදි නඩත්තු කිරීම සිදුකළ යුතුය. |
| (ඇ) ආචාර්ය උපාධි සම්පූර්ණ කිරීම සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු හා ප්‍රාග්ධන ප්‍රදාන ලබාදීම මගින් අදාළ ආචාර්යවරයාගේ දැනුම වර්ධනය වී එම දැනුම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වෙත ලබාදීම මගින් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කිරීම පිණිස මානව සම්පත් සංවර්ධනය කිරීමෙන් රටේ සමස්ත මානව ප්‍රාග්ධන වර්ධනය කරවීම අරමුණු කරගෙන වුවද කථිකාචාර්යවරුන් 12 දෙනෙකු එම සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් තොරව නැවත සේවයට වාර්තා කර තිබුණි. තවද, මෙම සුදුසුකම් සපුරාලීම නිර්ණය කරනුයේ අදාළ උපාධිය සම්පූර්ණ කිරීම තුළින් වන අතර මෙම ආචාර්යවරුන් හා විශ්විද්‍යාලය ඇතිකර ගත් බැඳුම්කර ගිවිසුම්වල වටිනාකම රු.54,791,505 ක් විය. | කථිකාචාර්යවරුන් 08 ක් ඉදිරියේදී ආචාර්ය උපාධි සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් පවතින අතර කථිකාචාර්යවරුන් 04 ක් ආචාර්ය උපාධිය සම්පූර්ණ කර නැත. | ආචාර්ය උපාධිය අදාළ කාලය තුළ සම්පූර්ණ කළ යුතුය. |
| (ඈ) 2008 වර්ෂයේ සේවයෙන් අස්කළ කාර්යමණ්ඩල සාමාජිකයෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව අභියාචනාධිකරණයේ පැවරූ නඩුවකට 2015 වර්ෂයේදී විශ්වවිද්‍යාලය වැරදිකරු කර තීන්දුව ලබාදී තිබුණු අතර ඊට එරෙහිව විශ්වවිද්‍යාලය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. පාලක සභා තීරණය මත 2017 වර්ෂයේදී මෙම නඩුව ඉල්ලා අස්කර ගෙන රු.7,649,419 ක හිඟ වැටුප් සමඟ 2018 වර්ෂයේදී එම නිලධාරියා නැවත සේවයේ පිහිටුවා තිබුණු අතර නඩු ගාස්තු ලෙස රු.125,000 ක මුදලක් ද වැයකර තිබුණි. | නඩුව සමථයකට පත්කිරීමට පාලකසභාව තීරණය කළ අතර ඒ අනුව වන්දි මුදලක් ගෙවා ඇත. | නඩු තීන්දුව ලබාදීමෙන් පසු නැවත නඩුවක් ගොනු කිරීමේදී පෙරදී ලබාදුන් නඩු තීන්දුවට එරෙහිව නඩුවක් ගොනු කිරීමට ඇති හැකියාව සළකා බැලිය යුතුය. |
| (ඉ) විශ්වවිද්‍යාලයට අයත් පිරිමි ළමුන් 500 දෙනෙකුට පහසුකම් සහිත නේවාසිකාගාරයකට ළමුන් 328 දෙනෙකු පමණක් ඇතුළත් කරගෙන තිබුණු අතර තවදුරටත් ළමුන් 172 දෙනෙකු ඇතුළත් කිරීමට පහසුකම් තිබියදී ළමුන් 114 දෙනෙකු සඳහා වෙනත් නේවාසිකාගාරයක් 2016 වර්ෂයේ සිට කුලියට ලබාගෙන ඒ සඳහා වාර්ෂිකව රු.1,500,000 ක කුලී මුදල් ගෙවා තිබුණි. | සිසුන්ගේ ගැටුම්කාරී තත්ත්වයන් වැලැක්වීමේ අරමුණින් වෙනම නේවාසිකාගාරයක් ලබාදී ඇත. | විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාර වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනයට ලබාදුන් තොරතුරු අනුව සමාජීය විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියකට 2014 වර්ෂයේ සිට 2018 පෙබරවාරි 12 දක්වාම අධ්‍යයන කාලසටහන්වලින් දේශන පැය වෙන්කිරීමක් සිදුකර නොතිබුණි. මෙම කථිකාචාර්යවරිය සේවයේ යෙදී සිටි බව සනාථ කරගැනීම සඳහා වූ එකම සාක්ෂිය වූයේ 2009 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ නිබන්ධන 20 ක පරීක්ෂක කටයුතු හා උත්තරපත්‍ර 306 ක් පරීක්ෂා කිරීම පමණි. 2014 ජනවාරි සිට 2018 පෙබරවාරි දක්වා කාලය තුළ කිසිදු සේවයක් ලබානොගෙන ඇයට වැටුප් හා දීමනා ලෙස රු.6,186,190 ක් ගෙවා තිබුණි. | කථිකාචාර්යවරිය විසින් අධ්‍යයන කටයුතු සඳහා දායක වී ඇත. | දේශන පැවැත්වීම සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුය. |

**3.4 අරමුදල් ඌන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාල පර්යෙෂණ ප්‍රදාන ගිණුමේ ඇතුළත් එකතුව රු.14,639,993 ක් වූ ශේෂ 17 ක් වර්ෂ 01 සිට වර්ෂ 03 දක්වා කාලයක සිට උපයෝජනය කර නොතිබුණි. | පර්යේෂණ ක්‍රියාත්මක නොකිරීම, ආචාර්යවරුන් විදේශගත වීම හා සමහර පර්යේෂණ නිමවී තිබීම වැනි හේතුන් නිසා මේ ප්‍රතිපාදන උපයෝජනය කර නැත. | පර්යේෂණ ප්‍රදාන උපයෝජනය කර විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය ඉහළ නැංවීමට ක්‍රියා කළ යුතුය. |
| (ආ) 2018 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශිෂ්‍යත්ව අරමුදල් හා තැගි අරමුදල් සම්බන්ධ පොළී ගිණුම් 38 ක ශේෂ පිළිවෙලින් රු.3,963,437 හා රු.5,526,486 ක් වී තිබුණත් සමාලෝචිත වර්ෂයේ ඉන් උපයෝජනය කර තිබුණේ පිළිවෙලින් රු.187,800 ක් හා රු.18,500 ක් බැගින් එකතුව රු.206,300 ක් පමණක් බැවින් ගිණුම් පිහිටුවීමේ අරමුණු ඉටුවී නොතිබුණි. | තැගි අරමුදල් සහ ශිෂ්‍යත්ව අරමුදල් පොදු අරමුදලකට බැර කර පොදු ප්‍රතිපත්තියක් යටතේ ක්‍රියාත්මක කිරීමේ හැකියාව සලකා බලමින් සිටී. | අරමුදල් පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් මුදල් උපයෝජනය කිරීමට සැලසුම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ විදේශ සිසුන් වෙනුවෙන් නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේ ලැබුණු රු.5,423,868 ක මුදල් ප්‍රදානයක් හා 2013 වර්ෂයේ ලැබුණු රු.1,026,890 ක තවත් ප්‍රදානයක් අදාළ අරමුණු සඳහා යොදවා නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | නේවාසිකාගාර ඉදිකිරීම සඳහා අපේක්ෂිත අරමුදල් නොලැබීම නිසා ආරම්භ කිරීම ප්‍රමාදවී ඇති අතර ඉදිරියේදී නේවාසිකාගාරය ඉදිකිරීම සඳහා කටයුතු කරමින් පවතී. | අදාළ අරමුණු වෙනුවෙන් ප්‍රදාන උපයෝජනය කිරීමට ක්‍රියා කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නියැදි පරීක්ෂාවකදී නිරීක්ෂණය වූ පරිදි රු.1,971,000 ක් වටිනා ක්‍රීඩා උපකරණ, රු.1,232,072 ක් වටිනා විද්‍යාගාර උපකරණ, රු.5,468,400 ක් වටිනා පරිගණක හා කාර්යාල උපකරණ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 01 සිට වර්ෂ 03 අතර කාලයක් තුළ ඌන උපයෝජිතව පැවතුණි. | සුදුසු ස්ථානයක් කඩිනමින් ලබාදෙන බව සහ ඉන්පසු ඒවා භාවිතයට යොදා ගැනීමට කටයුතු කර ඇත. | ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීමෙන් පසු සැලසුම් සහගතව මිලදී ගැනීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාජ විද්‍යා පීඨයේ කථිකාචාර්යවරුන් සඳහා රු.11,959,101 ක් වැයකර මිලදීගත් ලැප්ටොප් පරිගණක 110 කින් 07 ක් 2018 වර්ෂය අවසානය දක්වාම බෙදාදී නොතිබුණි. | ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීමට කටයුතු යොදා ඇත. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 8.9.1 (ආ) අනුව රු.500,000 ඉක්මවන සෑම මිලදී ගැනීමක් සඳහාම ගිවිසුමක් අත්සන් කළ යුතු වුවත් වටිනාකම රු.19,083,441 ක් වූ මිලදී ගැනීම් 9 ක් සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි. | මෙම කරුණ සම්බන්ධයෙන් එකඟවන අතර ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 8.9.1 (ආ) අනුව කටයුතු කරයි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශන අනුව කටයුතු කළ යුතුය. |

**3.7** අයවැය පාලනය

--------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්වවිද්‍යාලයේ ආදායම් පරීක්ෂා කිරීමේදී 2017 හා 2018 වර්ෂවල අයවැයගත ආදායම පිළිවෙලින් රු.650,554,000 ක් හා රු.597,000,000 වුවද තත්‍ය ආදායම පිළිවෙලින් රු.1,102,741,737 ක් හා රු.1,497,728,000 ක් වූයෙන් සියයට 69.5 සිට සියයට 150 ක විචලනයන් නිරීක්ෂණය විය. | නොවැලැක්විය හැකි හේතුමත ඇස්තමේන්තු ගත වියදම් හා සත්‍ය වියදම් අතර වෙනස්කම් ඇති විය. | අයවැය ලේඛනය කළමනාකරණ පාලන උපක්‍රමයක් ලෙස භාවිතා කළ යුතුය. |

**3.8** තිරසර සංවර්ධන අරමුණු

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු වේ. ඒ අනුව විශ්වවිද්‍යාලය විසින් තම විෂයපථය යටතට ගැනෙන කාර්යයන් නිසිපරිදි හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛය නිකුත් කිරීමට ප්‍රථම 2014 වසරේ සිට තිරසර සංවර්ධන කටයුතු කරමින් පවතී. | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |